# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1831/21 – 2013 ඔක්තෝබර් 09 වැනි බදාදා – 2013.10.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 289 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/10/2013/යූඩීජී/275.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: ශ්‍රී ජ'පුර/ඉඅ/12/02.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 ජූලි මස 17 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.

2. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිකඩ ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක සීඕ/කේටීටී/2008/400 හා 2009.01.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – වරි. අංක 300, ශ්‍රී ජයවර්ධනපුර මාවත – ප්‍රමාණය: හෙක්. 1.2072**

උතුරට: රෝයල් ගාර්ඩන් පාර, ශ්‍රී ජයවර්ධනපුර මාවත සහ කැබලි අක්ෂර බී; නැගෙනහිරට: ශ්‍රී ජයවර්ධනපුර මාවත සහ කොලොන්නාව ඇළ; දකුණට: කොලොන්නාව ඇළ සහ සිමෙන්ති කාණුව; බටහිරට: සිමෙන්ති කාණුව, රෝයල් ගාර්ඩන් සහ කැබලි අක්ෂර බී.

02. **කැබලි අක්ෂර 'බී' – වරි. අංක 294, ශ්‍රී ජයවර්ධනපුර මාවත – ප්‍රමාණය: හෙක්. 0.0959**

උතුරට: රෝයල් ගාර්ඩන් පාර සහ ශ්‍රී ජයවර්ධනපුර මාවත; නැගෙනහිරට: ශ්‍රී ජයවර්ධනපුර මාවත සහ කැබලි අක්ෂර ඒ; දකුණට: කැබලි අක්ෂර ඒ; බටහිරට: රෝයල් ගාර්ඩන් පාර සහ කැබලි අක්ෂර ඒ.

10 - 759

1A – G 18377 – 210 (2013/10)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39අ(1) වැනි වගන්තිය යටතේ නියමය

1991 ඔක්තෝබර් මස 01 වැනි දින අංක 682/18 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 1991 අංක 123 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, පහත I උපලේඛනයේ සඳහන් එම ඉඩම් කොටස මෙම නියමය මගින් අවසතු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ යොමු අංකය: 03ජේ/83/ඊ/255.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 3/62/698 (3/4/24/ii).
2013 සැප්තැම්බර් මස 30 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
අංක 1200/6,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

I වන උපලේඛනය

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ රිදීගම ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසයේ, මාදුරේ කෝරළේ සුළු කොට්ඨාසයේ, හිරිකැටේ ගමේ පිහිටි, කුරුණෑගල දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද ගම් පිඹුරු අංක 800 හා 2013.07.05 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 47 හා 48 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.7553ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස්:

01. **කැබලි අංක 47 – රිදීගම වත්ත ඉඩම – ප්‍රමාණය: හෙක්. 0.7073ක් පමණ**

උතුරට: කැබලි අංක 03; නැගෙනහිරට: මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගය; දකුණට: කැබලි අංක 49; බටහිරට: කැබලි අංක 03.

02. **කැබලි අංක 48 – රිදීගම වත්ත ඉඩම – ප්‍රමාණය: හෙක්. 0.0480ක් පමණ**

උතුරට: කැබලි අංක 49; නැගෙනහිරට: මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගය සහ කැබලි අංක 05; දකුණට: කැබලි අංක 05; බටහිරට: කැබලි අංක 49.

10 - 760

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.